www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප දිගු කාලීන ශ්‍රී ලංකා ට්‍රොට්ස්කිවාදියාට උපහාර පිනිස ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වයි

**SEP public meeting to pay tribute to veteran Sri Lankan Trotskyist**

**2005 මැයි 25**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප), පසුගිය අප්‍රේල් 14 දා නිදන්ගත පෙනහලු රෝගයකින් මිය ගිය දිගු කාලීන සසප සාමාජික වේලුපිල්ලෙයි සරවනපෙරුමාල් අනුස්මරනය කරනු පිනිස, යුද්ධයෙන් විනාශ වූ උතුරු පලාතේ අගනුවර වන යාපනයේ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත. යන්තම් 56 වන වියෙහි දී සිදු වූ ඔහුගේ අකල් මරනය ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට බලවත් පාඩුවකි.

ඔහුගේ පක්ෂ සහෝදරවරුන් හා මිතුරන් අතර "පාපා" යන ආදරනීය නාමයෙන් දැන සිටි සරවනපෙරුමාල්, 1975 දී සසප පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයට (විකොස) බැඳුනු අතර ඉන් අනතුරුව ඉදිරි 30 වසරක කාලය මුලුල්ලේම සමාජවාදී ජාත්‍යන්තරවාදයට ගැඹුරින්ම කැපවී ගෙන සිටියේ ය. නිරතුරුවම අසිරු වූ දේශපාලන හා පෞද්ගලික කොන්දේසි හමුවේ ඔහු සියලු ම ආකාරයේ ජාතිකවාදයන්ට හා ස්වෝත්තමවාදයන්ට විරුද්ධ වූ අතර දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන් ඔවුන්ගේ පොදු පන්ති අවශ්‍යතා වටා ඒකාබද්ධ කිරීමට සටන් වැදුනි.

සප්‍රතිපත්තික දේශපාලන අරගලයකින් යුක්ත සරවනපෙරුමාල්ගේ ජීවිතය, ශ්‍රී ලංකාවේ ධනේශ්වරය විසින් නිර්මිත වර්ගෝත්තමවාදී දේශපාලනයේ භයංකර මඩ වගුරෙන් මිදීමේ මාවතක් සොයන කම්කරුවන් හා තරුනයන් සඳහා වැදගත් පාඩම් සම්පාදනය කරයි. පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කේන්ද්‍රීය දේශපාලන අර්බුදය, රටේ මෘග විසි අවුරුදු සිවිල් යුද්ධයට මොන යම් හෝ ප්‍රගතිශීලී විසඳුමක් සෙවීමෙහි ලා පාලක පන්තියේ කිසිඳු කොටසකට පවත්නා නොහැකියාව අවධාරනය කරයි.

දිගුකාලීන ට්‍රොට්ස්කිවාදියකුට උපහාර පුදනු සහ ඔහු දෘඩතරව සටන් වැදුනු මූලධර්මවල දේශපාලන අර්ථභාරය සාකච්ඡා කරනු පිනිස යාපනයේ රැස්වීමට සහභාගි වන ලෙස, ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයනට, පක්ෂ ආධාරකරුවන්ට, මිතුරන්ට සහ සහෝදර කම්කරුවන්ට සසප ආරාධනා කර සිටී.

**දිනය සහ වේලාව: මැයි 29 වන ඉරිදා සවස 2.30**

**ස්ථානය: සමූපකාර ශ්‍රවනාගාරය, කන්කසන්තුරෙයි පාර. යාපනය.**

© www.wsws.org